ආදරණීය දුවේ පුතේ,

- **පහත සඳහන් ඡේදය කියවන්න.**

ගස

අපේ ගමේ වැව් ඉවුරේ විශාල ගසක් වූයේ ය. එය වැවට යන එන කාටත් සෙවණ දුන්නේ ය. එය සතුන්ට ද සෙවණ දුන්නේ ය. එය කුරුල්ලන්ට ආහාර දුන්නේ ය. දිනක් මහ සුළඟකට එය ඉදිරී වැටුණේ ය. එහි වටිනාකම කාටත් දැනුණේ එය නැති වූ විට ය.

ඡේදයෙන් පැවසෙන්නේ 'ගස' පිළිබඳ යි. ඒ පිළිබඳ විස්තර කිරීමට 'එය' යන්න භාවිත කර ඇත.
පහත ඡේදවල එය ලෙස යොදා විස්තර කරන්න

ගස

ගස වැවට යන එන අයට සෙවණ දුන්නේ ය.
. . . . . .
. . . . . .
ගස සතුන්ට ද සෙවණ දුන්නේ ය.
. . . . . .
ගස කුරුල්ලන්ට ආහාර දුන්නේ ය.
. . . . . .

හිස්තැනට 'එය' යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.
1. ග්‍රැමෆෝන් තැටිය ගීත වාදනයට උදවු වූවේ ය.
. . . . . මීට වසර ගණනාවක දී භාවිත වූවේ ය.
2. දුරකතනය කිහිප වරක් නාද වූවේ ය.
. . . . . මේසය මත තබා තිබුණේ ය.
3. කාමරය පිරිසිදු ව තිබුණේ ය.
. . . . . විවේක ගැනීමට ප්‍රිය තැනක් වූවේ ය.
4. කුඩය වැස්සේ දී පිහිට වූවේ ය.
. . . . . අව්වට ද ප්‍රයෝජනවත් වූවේ ය.
5. ගල් කුළ මහා පවුරක් ලෙස තිබුණේ ය.
. . . . . ආරක්ෂිත පවුරක් මෙන් වූවේ ය.

පහත සඳහන් මාතෘකා කියවන්න.
සෙල්ලම් ගෙදර, මගේ ගෙවත්ත, මගේ දිනපොත

මෙයින් එක් මාතෘකාවක් තෝරා ගෙන "එය" යොදා වාක්‍ය පහක් ලියන්න.

.....
.....
.....
.....
.....